සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසන් පෙරහුරු පරීක්ෂණය 2022 (2023)
## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

11 ශ්‍රේණිය | කාලය පැය- 01යි

නම- විභාග අංකය :

---

**සැලකිය යුතුයි :**
- **සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න

---

01. ග්‍රාමීය සමාජයේ පවතින බලිතොවිල් ආදියෙහි දක්නට ලැබෙන්නේ,
 1 සමූහ සන්නිවේදනයයි
 2 සාම්ප්‍රදායික සන්නිවේදනයයි.
 3 ජන සන්නිවේදනයයි.
 4 ග්‍රාමීය සන්නිවේදනයයි.

02. ග්‍රාහකයා අරමුණුකරගෙන සන්නිවේදකයා කරනු ලබන හැඟීම්, සිතිවිලි හෝ අදහස් ප්‍රකාශනය,
 1 සංජානයයි
 2 උත්තේජනයයි.
 3 සන්නිවේදනයයි
 4 සන්දේශනයයි.

03. වර්තමානය වන විට වඩාත් ප්‍රබල ලෙස සමාජානුයොජන කාර්ය ඉටුකරනු ලබන්නේ,
 1 රූපවාහිනිය විසිනි
 2 උපකාරක පන්ති විසිනි
 3 අන්තර්ජාලය විසිනි
 4 පුවත්පත් විසිනි

04. පුද්ගලයෙකුට තම මානසික සන්තුෂ්ටිය ඇතිකර ගැනීම උදෙසා ප්‍රයෝජනවත් ලෙස යොදාගත හැක්කේ,
 1 ප්‍රාසාංගික නාට්‍ය කලාවයි.
 2 රියැලිටි වැඩසටහන්ය
 3 ඡායාරූප ශිල්පයයි
 4 ධර්ම දේශනාවක් පැවැත්වීමයි.

05. දෘඪ පුවත්පත් බොහෝවිට දක්නට ලැබෙන්නේ ජාතික පුවත්පත්වල,
 1 මැද පිටුවේය
 2 තෝරාගත් පිටුවකය
 3 අග පිටුවේය
 4 මුල් පිටුවේය

06. ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද පළමු රූපවාහිනී විකාශනය වන්නේ,
 1 ජාතික රූපවාහනියයි
 2 ස්වාධීන රූපවාහිනියයි
 3 ස්වර්ණවාහිනියයි
 4 සිරස රූපවාහිනියයි

07. කන්ඩායම් සන්නිවේදනය සඳහා යොදාගන්නා ප්‍රක්ෂේපණීය උපකරණයක් වන්නේ,
 1 කාන්දම් ලෑල්ලයි
 2 බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රයයි
 3 පිටු පෙරළනයයයි
 4 සුදු ලෑල්ලයි

08. සන්නිවේදන ක්‍රියාවලිය නිරූපණය කරන ගණිතමය ආකෘතියක් ඉදිරිපත් කරන ලද්දේ,
 1 විල්බර් ශ්‍රාමිය
 2 ඔස්ගුඩ් හා ශ්‍රාමිය
 3 පැනොන් හා වීවර්ය
 4 ඇරිස්ටෝටල්ය

09. භාෂාවේ මූලික කාර්යයක් නොවන්නේ,
 1 මාධ්‍ය නියාමනය කිරීම
 2 වාචික ප්‍රකාශන ඉදිරිපත් කිරීම
 3 දැනුම සංරක්ෂණය කිරීම
 4 කාලය සන්නිවේදනය කිරීම

10. ආයතනයක් තුළ හරස් සන්නිවේදන අවස්තා ක්‍රියාත්මක වන ආකාරයක් වන්නේ,
1 පුවත්පත් වාර්තා
2 දැන්වීම් පුවරුව
3 පාරිසරික උපකරණ
4 දුරකථන පද්ධතිය

11. ශ්‍රී ලංකාවේ ප්‍රථම පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය වන ලේක් හවුස් ආයතනයේ ආරම්භකයා වන්නේ,
1 ඇම්. සී. ගුණසේන මහතා
2 ඩී.ආර්. විජයවර්ධන මහතා
3 උපාලි විජයවර්ධන මහතා
4 එච්.එස්. පෙරේරා මහතා

12. සමූහ සන්නිවේදනයේ දී විනිවිදක පත්‍ර භාවිතා කළ හැකි ප්‍රක්ෂේපන උපකරණ යොදාගනු ලබයි. එවැනි උපකරණයක් වන්නේ,
1 කදා ප්‍රක්ෂේපන යන්ත්‍රය
2 බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය
3 ප්‍රතිශීර්ෂ යන්ත්‍රයයි
4 අන්තර් ක්‍රියාකාරි පුවරුවයි

13. නව මාධ්‍ය බහුලව යොදාගන්නා මාධ්‍යයකි. එහිදී අදාලත්වයක් අඩුවෙන්ම දැකිය හැක්කේ,
1 භූගෝලීය සීමා නොමැතිවීම
2 ග්‍රාහකයන් සැමට එකම සංදේශය ලැබීම
3 අංකිත මාධ්‍ය උපකරණ භාවිතා කිරීම
4 ගෝලීය ව්‍යාප්තියක් සහිත වීම

14. වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි සහගත තත්වයක් නොවන්නේ,
1 කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීම
2 කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම
3 කාර්යාලයක තොරතුරු වේගයෙන් නිකුත් කළ හැකිවීම
4 කාර්යාලයේ තොරතුරු ඕනෑම කෙනෙකුට ලබාගත හැකි වීම

15. ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිණෙන හේතුවන් නොවන්නේ,
1 පිළිගත් සංකේත පද්ධතියක් යොදා ගැනීම
2 සංදේශය තුළ විවිධවූ අර්ථ තිබීම
3 වැරදි තොරතුරු සංදේශය තුළ ගොනුකර තිබීම
4 ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැළපීම

16. ජී.පී. පැලිස් අප්පුහාමි මහතා විසින් සංස්කරණය කරන ලද පුවත්පතක් වන්නේ,
1 දිනමිණ
2 ලක්මිණි පහන
3 කවට කතිකයා
4 උයදනාරකෙ

17. ලක්මිණි පහන පුවත්පත 1862 දී සංස්කරණය කර ප්‍රකාශයට පත් කරන ලද්දේ,
1 කොග්ගල පාඩිතුමාය
2 අනගාරික ධර්මපාලතුමාය
3 බුලත්ගම ධම්මාලංකාර හිමිය
4 හෙන්ඩ්‍රි මාටින්ය

18. ඡායාරූප කරණයේ දී දැකිය හැකි පටල වේගය හඳුන්වන තවත් නමක් වන්නේ,
1 රූප සංරචනයයි
2 සංවේදිතාවයයි
3 ස්වර්ණමය රීතියයි
4 නාභිගත කිරීමයි

19. එක් පුද්ගලයෙකු කේන්ද්‍රකොටගෙන පුද්ගලයන් වැඩි දෙනෙකු වෙත පණිවිඩය පැතිර යන විධිමත් සන්නිවේදන අවස්ථාවක් වන්නේ,
1 වයි ආකෘතිය
2 දාම ආකෘතිය
3 රෝද ආකෘතිය
4 චක්‍රීය ආකෘතිය

20. මාධ්‍ය බාධක හේතුවෙන් සංඥාවලට හානි සිදුවන්නට හැකි බව පෙන්වා දී ඇත්තේ,
1 ෂැනොන් විවර් සූත්‍රයයි
2 ද්විපාර්ශවික සූත්‍රයයි
3 ලැස්වෙල් ආකෘතියයි
4 ග්‍රැහැම් බෙල් දුරකථනයයි

21. වර්තමාණයේ කාලය හා අවකාශය මිලදී ගැනීම මත පදනම් වූ තොරතුරු සන්නිවේදන ක්‍රමය වන්නේ,
1 දැන්වීම්කරණයයි
2 ප්‍රවර්ධනයයි
3 ප්‍රචාරනයයි
4 වාරනයයි

22. කිසියම් වාර්තාකරුවෙකු විසින් නිරන්තරයෙන් රැඳී සිටිමින් දිගින් දිගටම සිදුකරණ ආවරණය,
1 නිදහස් වාර්තාකරණයයි
3 බිට්වූ වාර්තාකරණයයි
2 ප්‍රදේශීය වාර්තාකරණයයි
4 විශේෂාංග වාර්තාකරණයයි

23. ස්වයං වාරණය ලෙසින් හඳුන්වනු ලබන්නේ,
1 ජනමාධ්‍ය හිමිකරුවාගේ පාලනයට යටත් වීමයි
3 රජය මගින් පාලනය කිරීමයි
2 පොදු සම්මුතින් සලකා බලා වාරණය කිරීමයි
4 ආචාර ධර්මයන්ට යටත් වීමයි

24. දිනපතා පලකරන පුවත්පතක ප්‍රවෘත්ති සංස්කාරක වරයාගේ ක්‍රියාකාලාපය වන්නේ,
1 කාලීන ප්‍රවෘත්ති රචනා කිරීමයි
3 සංස්කාරක වැකිය රචනාකිරීමයි
2 තොරාගත් ප්‍රවෘත්ති සංස්කරණයයි
4 වාර්තාකරුවන් සංස්කරණය කිරීමයි

25. පන්තිකාමරයක් තුළ දෘශ්‍ය ආධාරක ක්‍රම යොදාගැනීම සිදුවේ. එම ක්‍රමවේදයන් හා නොගැලපෙනුයේ,
1 දරුවන් තුල උනන්දුව ඇති වීමයි
3 අධික ලෙස කාළය ගතවීමයි
2 දරුවන් සක්‍රියව දායක කර ගැනීමයි
4 නිරවුල් බව පවත්වා ගත හැකි වීමයි

26. පුවත්පත් ජායාරූප කරණයේ ආචාරධර්මයක් සේ පිළිගත හැකි තත්වයක් වන්නේ,
1 පුද්ගලයන්ගේ පෞද්ගලික අවස්තා ජායාරූප ගත කිරීම
2 පොදු උත්සව අවස්තාවන් ජායාරූප ගත කිරීම
3 අනුකම්පාව ඇතිවන ආකාරයේ සංවේදී ජායාරූප පලකිරීම
4 අපචාරයන්ට ලක්වූ අයවලුන්ගේ සමීප ඡායාරූප පලකිරීම

27. ගුවන්විදුලි මාධ්‍යයේ නාට්‍ය සම්බන්දයෙන් නොගැළපෙන ප්‍රකාශනය තොරන්න.
1 චිත්ත රූප ඇතිකරයි
3 ශබ්ද ප්‍රයෝග යොදාගනී
2 චරිත රැසක් යොදා ගනි
4 සංගීතය යොදාගනී

28. සිනමා නිර්මාණයක අන්තර්ගතය තීරණය වන්නේ,
1 කැමරාකරනය මතය
3 රංගනය මතය
2 නිෂ්පාදණය මතය
4 තිර පිටපත මතය

29. බස් නැවතුම්පළක රැඳීසිටින අහඹු ලෙස හමුවූ පුද්ගලයන් අතර ඇතිවිය හැකි සන්නිවේදනයක් වන්නේ,
1 අවිධිමත් සන්නිවේදනයයි
3 අන්තර් පුද්ගල සන්නිවේදනයයි
2 අන්තර් වර්ති සන්නිවේදනයයි
4 විධිමත් සන්නිවේදනයයි

30. කතුවරයෙකු විසින් රචනා කල සාහිත්‍යමය කෘතියක් සඳහා එය මුද්‍රණය කොට අලෙවිකරණ ප්‍රකාශන ආයතනය මගින් රචකයාට ලබාදෙන මූල්‍යමය ප්‍රතිලාබය යනු,

1 බුද්ධිමය දේපළයි
3 කතෘ භාගයයි
2 ප්‍රකාශණ හිමිකමයි
4 මූල්‍යමය හිමිකමයි

31. සහජීවනය ඇතිකිරීම සඳහා ප්‍රධාණ වශයෙන්ම බලපානු ලබන සාදකයක් වන්නේ,
1 සදාචාරය හා සාරධර්මයයි
3 මානව ධර්මතා හා වටිනාකම්ය
2 වාර්ගිකත්වය හා ජාතිවාදයයි
4 මානව හිමිකම හා වගකීමය

32. ආයතන ප්‍රධානියෙකුගේ ලිකිත ප්‍රකාශණයක වලංගුතාවය සඳහා අත්සන හා සමගාමීව යොදාගනු ලබන්නේ,
1 සන්නාමයයි
3 ආයතනයේ නාමයයි
2 දිනයයි
4 නිල මුද්‍රවයි

33. සාවද්‍ය ප්‍රකාශනය තොරන්න
1 වත්මන් සමාජයේ බහුලව යොදාගනු ලබන්නේ අංකිත හෝවත් ඩිජිටල් කැමරාය
2 ආංකිත කැමරාවක් මගින් ගත් ජායාරූප එවෙලේම නැරබීමට හැකියාව ඇත
3 පික්සල් ප්‍රමානය වැඩිවන විට ජායාරූපයේ ගුණාත්මක බව ක්‍රමයෙන් අඩුවේ
4 නිස්චල ජායාරූපකරනයේ දී පටල වේගය සංවේදීතාවය ලෙස හඳුන්වයි

34. ලංකාවේ පළකරන ලද ප්‍රථම සිංහල සඟරාව වනුයේ,

1 මාසික තෑග්ග සඟරාව
2 උරගල සඟරාව
3 සමුදුර සඟරාව
4 මනහර සඟරාව

35. මෙරට රූපවාහිනී වැඩසටහන් කිහිපයක ලක්ෂණ පහතින් දැක්වේ,

A- ආදර්ශමත් සාමාජීය හා කාලීන තොරතුරු ඇතුලත්වේ
B- අඩු වියදමින් වැඩි කොටස් ගනනාවක් රූප ගත කරයි
C- විවිධ හඬකැවීම් හා ප්‍රයෝග බහුලව සිදුකරයි
D- නිෂ්පාදනය අවසන් වීමට පෙර විකාශණය කරයි

මේ අතරින් මෙරට මෙගා ටෙලිනාට්‍යයක ලක්ෂණ අන්තර්ගත වනුයේ,

1 A හා B අතරය
2 B හා C අතරය
3 C හා D අතරය
4 B හා D අතරය

36. මෙරට ප්‍රකාශණය වූ ද්‍රවිඩ මාධ්‍ය පුවත්පතක් නොවන්නේ,

1 වීරකේසරී
2 තිනක්කුරල්
3 මිතිරන්
4 මතිරත්තම්

37. දේශණයක් පවත්වන අතරතුර සන්නිවේදකයා ජංගමශීලි තත්වයකට පත්වන්නේ,

1 රැහැන් රහිත මයික්‍රෆෝනය යොදාගැනීම නිසාය
2 ආලෝක රටා යොදාගැනීම නිසාය
3 වේදිකාවේ උස් පසුතලය නිසාය
4 මයික්‍රෆෝන යොදාගැනීම නිසාය

38. ISBN- අංකය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ,

A- මෙම අංකය ලංකාව තුල වලංගුතාවයක් නොමැත
B- නවකතා සඳහා පමණක් මෙය බහුලව යොදාගනී
C- මෙම අංකය මගින් පොතක් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වේ
D- පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් නිකුත් කරයි

මෙම ප්‍රකාශණ අතරින් සාවද්‍ය ප්‍රකාශයන් ලෙස හඳුනාගත හැක්කේ,

1 A හා B ය
2 B හා C ය
3 C හා D ය
4 B හා D ය

39. සංවෘත පරිපථ රූපවාහිනී කැමරා පිළිබඳ කරුණු කිහිපයක් පහතින් දැක්වේ,

A- සුපිරි වෙළඳ සැල් සඳහා පමනක් භාවිතා කරයි
B- ව්‍යාපාරයක ගනුදෙනුකරුවන් පරීක්ෂාකිරීමට යොදාගනු ලබයි
C- පාලන මැදිරියක සිට නිරීක්ෂණය කල හැකි වේ
D- සෑම විටම සමාජ ජාල හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරයි

ඉහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශන අඩංගු වරණයන් වන්නේ,

1 A හා B ය
2 B හා C ය
3 C හා D ය
4 B හා D ය

40. මෙරටදී නව රූපවාහිනී නාලිකාවක් ඇරඹීම කිරීම සඳහා බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලියට සෘජුවම දායක වන ආයතනයක් වන්නේ,

1 රූපවාහිනී අභ්‍යාස ආයතනයයි
2 ප්‍රවෘත්ති දේපාර්තමේන්තුවයි
3 විදුලි සංදේශ නියාමන කොමිසමයි
4 ජනමාධ්‍ය අමාත්‍යංශයයි

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## අවසන් පෙරහුරු පරීක්ෂණය (2022-2023)
### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

11 ශ්‍රේණිය | කාලය පැය- 02යි

නම- විභාග අංකය :

---

**සැලකිය යුතුයි :**

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. කැබැල්ලෑවල රතනසිරි මහා පිරිවෙන් පරිශ්‍රයේ මෙවර රාජ්‍ය වෙසක් මහෝත්සවය පවත්වන අතර එහි පූර්ව ප්‍රචාරණ කටයුතු වලදී භාෂාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බව එහි මාධ්‍ය අංශය අවධාරණය කර තිබුණි.

1 එළදායි ලේඛනයක ලක්ෂණ දෙකක් නම්කරන්න

2 ලිපියක් රචනා කිරීමේදී යොදාගත හැකි නිර්මානාත්මක භාෂා ප්‍රකාශණ විධි දෙකක් නම් කරන්න

3 ප්‍රචාරණයේදී යොදාගන්නා ලිඛිත භාෂාව විධිමත් වීමට අදාළ කරුණු දෙකක් දක්වන්න

4 මෙම උත්සවය පිළිබඳ පුවත්පත් ප්‍රචාරණයේදී යොදාගත හැකි ඡායාරූප වර්ග දෙකක් දක්වන්න

5 ප්‍රචාරණයේදී භාවිතාවන මුද්‍රිත මාධ්‍ය ස්වරූප දෙකක් නම් කරන්න

6 ප්‍රධාන ග්‍රාහක ස්වරූප දෙකක් නම්කරන්න

7 රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී යොදාගන්නා වැඩසටහන් වර්ග දෙකක් නම් කරන්න

8 උත්සව භූමිය තුල යොදාගත හැකි ප්‍රක්ෂේපණීය උපකරණ දෙකක් නම් කරන්න

9 ප්‍රචාරණයේදී යොදාගත හැකි රාජ්‍ය දායකත්වය සහිත ගුවන්විදුලි මාධ්‍ය ආයතන දෙකක් නම්කරන්න

10 මෙවැනි සන්නිවේදන කටයුත්තක් අතර ඇතිවිය හැකි මූලික බාධක වර්ග දෙකක් දක්වන්න

02. සන්නිවිදනය යනු තොරතුරු හුවමාරුවයි. එය සාර්ථක වීම සඳහා මූලිකාංග අවශ්‍ය වේ.

1 සන්නිවේදනයේ ස්වරූප දෙකක් දක්වන්න

2 සන්නිවේදනයේ මූලිකාංග හතරක් දක්වන්න

3 සන්නිවේදන වර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න

4 නිර්වාචික සන්නිවේදනයේදී යොදාගන්නා විධික්‍රම හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න

03. පරිගණක ආශ්‍රිත උපකරණ හේතුවෙන් වර්තමාන මුද්‍රිත මාධ්‍ය කටයුතු සංවර්ධනයට ලක්ව ඇත.

1 මෙරට පළකරන පෞද්ගලික ව්‍යාපාරික පුවත්පත් දෙකක් ලියා දක්වන්න

2 මුද්‍රිත මාධ්‍යයන් වල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියා දක්වන්න

3 එළදායි ලේඛනයක ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න

4 පුවත්පත් ප්‍රකාශනයේදී එහි අන්තර්ගතයේදී දැකිය හැකි තොරතුරු වර්ග හතරක් පැහැදිලි කරන්න

04. නිශ්චල ඡායාරූපකරනය යනු දර්ශණයක එක් නිමේෂයක් සටහන් කර ගැනීමකි. ඒ සඳහා වඩාත් වැදගත් වන්නේ ලෝකය දෙස බලන්නට හොඳ ඇසක් තිබීමය.

1 නිශ්චල ඡායාරූපකරනය සඳහා යොදා ගන්නා කැමරා වර්ග දෙකක් නම් කරන්න

2 නිශ්චල ඡායාරූපකරනය පුද්ගලයෙකුට ප්‍රයෝජනවත් වන ආකාර දෙකක් දක්වන්න

3 ආංකිත හෙවත් ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතාවයන් තුනක් කෙටියෙන් විස්තර කරන්න

4 සේයා පටලය, විභේදන බලය, ස්වර්ණමය රීතිය, පැහැ අන්තරය පිලිබඳව පැහැදිලි කරන්න

05. තොරතුරු සම්පාදනය යනු අදවන විට ලෝකයේ වානිජමය මුහුණුවරක් ගත් ව්‍යාපාරයක් බවට පත්ව තිබේ.

1 ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන තොරතුරක ප්‍රයෝජන දෙකක් දක්වන්න

2 තොරතුරක් යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න

3 ජනමාධ්‍ය ආයතනයක් වෙත තොරතුරු ලබාදෙන්නෙකුගේ ගුණාංග තුනක් කෙටියෙන් විස්තර කරන්න

4 පුවත්පතක තොරතුරු ඉදිරිපත් කලහැකි ආකෘති හතරක් පැහැදිලි කරන්න

06. වෙළඳපෙළ ආර්ථිකයක් මුල් කර ගත් වර්තමාන සමාජයෙහි ජනමාධ්‍යයට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි.

1 ජනමාධ්‍ය සතු ලක්ෂණ දෙකක් දක්වන්න

2 ජනමාධ්‍ය මගින් ළමයකු තුළ ඇතිකරන සෘණාත්මක බලපෑම් දෙකක් දක්වන්න

3 ගුවන්විදුලි මාධ්‍ය වැඩසටහන් වර්ග තුනක් පිලිබඳව කෙටියෙන් විස්තර කරන්න

4 රූපවාහිනිය ප්‍රධාන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි, එහි විශේෂතාවයන් හතරක් පැහැදිලි කරන්න

07. වත්මන් සමාජයේ ක්‍රියාකාරකම් පහසුවෙන් කර ගැනීම සඳහා පුද්ගලයන් අන්තර්ජාල මාධ්‍ය වෙත යොමුවන බව නිරන්තරයෙන් දැකගත හැකිය.

1 සුප්‍රසිද්ධ සමාජ ජාල මාධ්‍ය යෙදවුම් දෙකක් නම්කරන්න

2 විද්‍යුත් තැපැල මගින් සන්දේශයක් යැවීම සඳහා තිබිය යුතු අංග දෙකක් දක්වන්න

3 ජංගම දුරකතන භාවිතයේදී පිලිපැදිය යුතු ආචාරධර්ම තුනක් කෙටියෙන් විස්තර කරන්න

4 අන්තර්ජාලයේ ප්‍රයෝජන හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න

***